COLOMBO | 2019 - 2024

social media declaration

Version 2.0

#EngageSMinSL

Collective for Social Media Declaration [CSMD]

අයේෂා ජිනසේන මහත්මිය(PC)

ලේකම්,

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය,

අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,

කොළඹ 10.

15.02.2026

**විෂය: 2026 අංක දරන ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත (PSTA) වහාම ඉවත් කර ගැනීම පිළිබඳව.**

ඔබ අමාත්‍යංශ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇති 'ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත' (PSTA) සම්බන්ධයෙන් පවතින බරපතල විරෝධය සහ එහි අඩංගු මර්දනකාරී විධිවිධාන පිළිබඳව මෙම ලිපිය මගින් අවධාරණය කිරීමට 'සමාජ මාධ්‍ය ප්‍රකාශනය සඳහා වූ සාමූහිකය (CSMD)' කැමැත්තෙමු. මෙම පනත හුදෙක් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) මර්දනකාරී ව්‍යුහය එලෙසම සහ එයටත් වඩා බරපතල තත්ත්වයන් ප්‍රතිනිර්මාණය කිරීමක් බව අධ්‍යයනයන් තුළින් පැහැදිලි වෙයි.

‘ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත’ (PSTA) සම්බන්ධයෙන් පැන නැගී ඇති මූලික ප්‍රතිචාර නිරීක්ෂණය කිරීමේදී, එය පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකමක් වන ප්‍රකාශනයේ නිදහස ඇතුලු අයිතිවාසිකම් දැඩි ලෙස අඩපණ කරන මෙවලමක් බවට පත්වීමේ බරපතල අනතුරක් පවතින බව අපි පෙන්වා දෙමු.

මෙම පනත් කෙටුම්පතේ පවතින අතිශය මර්දනකාරී, ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපාදන හේතුවෙන් එය වහාම ඉවත් කර ගන්නා ලෙස පහත කරුණු කිහිපය පදනම් කර ගනිමින් ඉල්ලා සිටිමු:

● අපැහැදිලි නිර්වචන සහ ප්‍රකාශන නිදහස මර්දනය: ‘ත්‍රස්තවාදය’ යන්න අපැහැදිලි ලෙස අර්ථ දැක්වීම - PSTA පනත් කෙටුම්පත තුළ ත්‍රස්තවාදය යන්නට ලබා දී ඇති නිර්වචනය අතිශය පුළුල් සහ අපැහැදිලි ය. රජයේ ක්‍රියාකලාපයන් විවේචනය කිරීම, සාමකාමී විරෝධතාවල නිරත වීම හෝ පාලකයන්ට අප්‍රසන්න/ අකමැති අදහස් පළ කිරීම පවා, 'රජයට එරෙහිව ජනතාව පොළඹවන' හෝ 'රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක්' වන ක්‍රියාවන් ලෙස අර්ථකථනය කිරීමට මෙමගින් ඉඩ ප්‍රස්ථාව සැලසේ.

● රහස්‍ය තොරතුරු සහ සිවිල් ක්‍රියාකාරකම් (78 වැනි වගන්තිය): 'රහස්‍ය තොරතුරු' යන්න පුළුල් ලෙස අර්ථ දැක්වීම හරහා සාමකාමී විරෝධතාවල ඡායාරූප ගැනීම හෝ සිවිල් කටයුතුවලට ආරක්ෂක අංශ මැදිහත්වීම පිළිබඳ වාර්තා කිරීම පවා අපරාධයක් බවට පත්කිරීමේ අවදානමක් පවතී

● අනිවාර්ය තොරතුරු වාර්තා කිරීමේ බලපෑම (15 වැනි වගන්තිය): ත්‍රස්තවාදී වැරදි පිළිබඳ තොරතුරු ලබාදීමට අපොහොසත් වීම වසර හතක සිර දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස නම් කිරීම මගින් මාධ්‍යවේදීන්, නීතිඥයන් ඇතුලු වෘත්තිකයන්ගේ මෙන්ම ආගමික නායකයන්ගේ වෘත්තීය රහස්‍යභාවය සහ සදාචාරාත්මක බැඳීම් බරපතල ලෙස උල්ලංඝනයට ලක් විය හැකිය.

● ඩිජිටල් සන්නිවේදනයට එල්ල වන තර්ජනය (55 වැනි වගන්තිය): මහේස්ත්‍රාත්වරයෙකුට ගුප්තකේතනය කළ (Encrypted) පද්ධති විවෘත කිරීමට (Decrypt) නියෝග ලබා දීමේ බලය පැවරීම හරහා පුද්ගලික ඩිජිටල් සන්නිවේදනයේ රහස්‍යභාවය සම්පූර්ණයෙන්ම අහෝසි වීමේ අවදානමක් පවතී. අන්තර්ජාලය සහ ඩිජිටල් අවකාශය තුළ සන්නිවේදනය දැඩි ලෙස නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට පනතින් ලබා දෙන බලතල මගින්, පුද්ගලයන්ගේ සන්නිවේදන අයිතිය අහිමි වන අතර එය ප්‍රජාතන්ත්‍රවාදී සංවාදයකට ඇති ඉඩකඩ මුළුමනින්ම අහුරා දමයි.

● හමුදාවට පොලිස් බලතල පැවරීම සහ රඳවා තබා ගැනීම (19, 20, 24 වැනි වගන්ති): හමුදාවට සහ වෙරළාරක්ෂක නිළධාරීන්ට අත්අඩංගුවට ගැනීම් සහ සෝදිසි කිරීම් සඳහා බලය පැවරීම සහ පුද්ගලයන් රඳවා තබා ගැනීමට අවසර ලබා දීම මගින් මර්දනකාරී පාලනයකට මග පාදයි.

● මාධ්‍යවේදීන් සහ සිවිල් ක්‍රියාකාරීන් ඉලක්ක කිරීම: තොරතුරු වාර්තා කිරීමේදී සහ මහජන මතය ගොඩනැගීමේදී මාධ්‍යවේදීන්ට සහ සමාජ මාධ්‍ය පරිශීලකයින්ට මෙම පනත යටතේ දැඩි පීඩනයක් එල්ල විය හැකිය. "ත්‍රස්තවාදයට අනුබල දීම" යන ලේබලය යටතේ ඕනෑම විවේචනාත්මක වාර්තාකරණයක් නීතියේ දැලට හසුකර ගැනීමට බලධාරීන්ට හැකි වීම නිසා මාධ්‍ය නිදහස අඩපණ කරන මෙන්ම ස්වයං-වාරණය/'භීතියේ සෙවනැලි'(Chilling Effect) රජයන යුගයක් නිර්මාණය වනු ඇත.

මෙම පනත් කෙටුම්පත මගින් සාමාන්‍ය අපරාධ නීතියට පරිබාහිරව විධායකයට අසීමිත බලතල පවරා දී ඇති අතර, එය සිවිල් වැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් බරපතල ලෙස අනතුරේ හෙළයි. එසේම, මෙවැනි විශේෂ මර්දනකාරී පනත් වෙනුවට, රටේ දැනට පවතින සාමාන්‍ය අපරාධ නීතිය(අවශ්‍ය නම් ජාත්‍යන්තර මානව හිමිකම් රාමුවලට පටහැනි නොවන අකාරයට) දියුණු කරමින් සහ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම මගින් පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම් තහවුරු කිරීම මගින් මහජනයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකියාව පවතින බව අපි අවධාරණය කරමු.

එබැවින්, ජාතික ආරක්ෂාව යනු ප්‍රකාශනයේ නිදහස ඇතුලු ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් මරා දැමීම සඳහා භාවිතා කරන 'හිස් චෙක් පතක්' නොවිය යුතුය. එබැවින් මානව අයිතිවාසිකම් මර්දනය කරන, පුරවැසියාගේ හඬ යටපත් කරන මෙම PSTA පනත් කෙටුම්පත වහාම ඉවත් කර ගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු.

නිදහස් මතයන් යටපත් කිරීමෙන්, පෞද්ගලිකත්වයට ඇති අයිතිය ඇතුලු මානව අයිතිවාසිකම් අඩපණ කිරීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කළ නොහැකි බවත්, එයින් සිදුවන්නේ, යෝජිත ඩිජිටල් ව්‍යාපෘතිවල ඇති හරයාත්මක තත්ත්වයන්ට බලපෑම් එල්ල වීමත්, විදෙස් ආයෝජන සහ එවැනි ප්‍රතිලාභවලට දැවැන්ත බලපෑමක් එල්ලවීමත් හරහා සමාජය අස්ථාවර වීම සහ ඒකාධිපතිවාදයට මඟ පෑදීම බවත් අපි වැඩිදුරටත් අවධාරණය කරමු. එම නිසා 'සමාජ මාධ්‍ය ප්‍රකාශනය සඳහා වූ සාමූහිකය (CSMD)' නැවතත් අවධාරණය කරනු ලබන්නේ, යෝජිත ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත (PSTA)' ඉවත් කරගන්නා ලෙසත්, ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට පත්වීමට පෙර ජනතාවට ලබා දුන් පොරොන්දුව පරිදි 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' (PTA) අහෝසි කරමින් ජන වරමේ සැබෑ අභිලාෂයන් ඉටු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.


මෙයට විශ්වාසී,

සම්පත් සමරකෝන්,

කැදවුම්කරු,

'සමාජ මාධ්‍ය ප්‍රකාශනය සඳහා වූ සාමූහිකය (CSMD)'

+94 777 248304

**ABOUT CSMD:** The Social Media Declaration collective is a coalition established by civil society organizations, citizen activists, websites, and subject-matter experts, with the aim of promoting a 'human rights–based', Socially Responsible use of Social Media'. This collective is dedicated to advancing human rights, including digital rights, and to systematically analyzing online content through research, advocacy, training, awareness-raising, and critical inquiry. It continuously strives to foster and sustainably promote democratic discourse in online spaces grounded in internet freedom, transparency–openness, and democratic values. In this way, the collective remains committed to ensuring societal well-being through the influence of technology and to encouraging the development of responsible, ethical use of social media in the digital age.

The following organizations belong to this collective. **Sri Lanka Working Journalists Association | Jaffna Press Club | Eastern Provinces Journalists forum | Centre for Policy Alternatives | Sri Lanka Muslim Media Forum | Human Elevation Organization | Law & Society Trust | SARVODAYA Shramadana Movement | Movement for Land and Agricultural Reform | ActNow Youth Campaign | Wedabima Media collective | National Collaboration Development | Foundation Best Vision foundation | Internet Media Action | maatram.org | vikalpa.org | groundviews.org | minormatters.org**



socialmedialanka.org | smdsrilanka@gmail.com | @SMDsrilanka
facebook.com/socialmedia-srilanka | @SMDsrilanka.bsky.social | +94 777 248304